**ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය**
**කොළඹ, ශ්‍රී ලංකාව**

## විවාහ ගිවිස ගැනීම මත වීසා අයදුම්කරුවන් සඳහා උපදෙස්

ඔබේ විවාහ ගිවිස ගැනීම මත පදනම් වූ සික්‍රමණ වීසා සම්මුඛ පරීක්ෂණය සඳහා පහත දැක්වෙන ලේඛන අවශ්‍ය වේ. **ඔබේ සම්මුඛ පරීක්ෂණ වේලාවට මිනිත්තු 15කට පෙර පමණක් පැමිණ සිටින්න.**

1. https://ceac.state.gov/ceac/ හි ඇති DS-260 පෝරමය සබඳිව පුරවා ලැබුණු බව තහවුරු කිරීමේ පිටුව (confirmation receipt page) රැගෙන එන්න.
2. එක්සත් ජනපදයට ගමන් කිරීමට බලාපොරොත්තු වන දිනයේ සිට ඉදිරියට මාස හයකට වැඩි කාලයකට වලංගු වන ගමන් බලපත්‍රය
3. මුහුණේ කිසිම කොටසක් ආවරණය නො කර ඉදිරිපස පෙනුම දක්වන, ළා පැහැති පසුබිමක ගත් 2"X2"වර්ණ ඡායාරූපයක්.
4. **සිවිල් ලේඛන**
   - උප්පැන්න සහතිකයේ මුල් පිටපත, පරිවර්තන හා ඡායා පිටපත් කට්ටලයක්
   - විවාහ සහතිකයේ මුල් පිටපත, පරිවර්තන හා ඡායා පිටපත් කට්ටලයක්
   - (අදාළ නම්) අවසාන තීන්දුව දක්වන දික්කසාද සහතිකයේ මුල් පිටපත, පරිවර්තන හා ඡායා පිටපත්
   - (අදාළ නම්) කලත්‍රයාගේ මරණ සහතිකයේ මුල් පිටපත, පරිවර්තන හා ඡායා පිටපත් කට්ටලයත්
5. **ආධාර කිරීම පිළිබඳ දිවුරුම් සහතිකය (I-134 පෝරමය)** - මෙය ලබා ගත යුත්තේ ඔබේ එක්සත් ජනපද අනුග්‍රාහකයාගෙනි. මෙම දිවුරුම් සහතිකය සමග පහත දැක්වෙන ලේඛනවලින් එකක් එවිය යුතුය.
   - ඉතාම මෑත බදු වර්ෂය සඳහා වූ අනුග්‍රාහකයාගේ අභ්‍යන්තර ආදායම් සේවා (IRS) වාර්තා
   - එක්සත් ජනපද අනුග්‍රාහකයාගේ බදු වාර්තා සමග සෑම හා සියලු W-2 හා 1099 පෝරමවල (Form W-2 and Form 1099) පිටපත්
   - **බදු වාර්තා ලබා ගැනීමට** https://www.irs.gov/individuals/get-transcript වෙබ් අඩවියේ ඇති 4506-T පෝරමය භාවිතා කළ හැක.

6. **සම්පූර්ණ කළ වෛද්‍ය පරීක්ෂණ පෝර්ම** - ඔබ වෛද්‍ය පරීක්ෂණය හා එන්නත් කිරීම් සම්පූර්ණ කිරීමෙන් පසු මේවා වෛද්‍යවරයා විසින් ඔබට ලබා දෙනු ඇත. පහත දැක්වෙන වෛද්‍යවරුන්ගෙන් එක් කෙනෙක් හමු වී ඔබේ සම්මුඛ පරීක්ෂණයට පෙර වෛද්‍ය වාර්තා ලබා ගන්න.

**වෛද්‍ය මණ්ඩල සාමාජිකයෝ**

වෛද්‍ය ගීතා පී. ලියනගේ/වෛද්‍ය නිමල් හේරත්-ගුණරත්න
ආසිරි ශල්‍ය රෝහල
21, කිරිමණ්ඩල මාවත
කොළඹ 05
දුරකථන: 011-45214400, 011-45412818, 011-45412819

ඉ-තැපෑල: geethaliyanage@hotmail.com
ඉ-තැපෑල: nimlag2001@yahoo.com

වෛද්‍ය නිමල් හේරත්-ගුණරත්න
ආසිරි චිකිත්සක සේවා, 175 පේරාදෙණිය පාර, මහනුවර
දුරකථන: 081-738-9020
ඉ-තැපෑල: kandylab@asiri.lk

7. **ගාස්තු** - $ 325 හෝ ශ්‍රී ලංකා රුපියල් 48,750/= කරුණාකර "එක්සත් ජනපද තානාපති කාර්යාලය, කොළඹ" (US EMBASSY, COLOMBO) යනුවෙන් සඳහන් බැංකු අණකරයක් රැගෙන එන්න. බැංකු අණකරයේ පිටුපස ඔබේ සම්පූර්ණ නම හා ගමන් බලපත්‍ර අංකය ලියන්න. වීසා ගාස්තු ගෙවීමට ඔබට මුදල් ගෙන ඒමට ද පුළුවන. (නියමිත ප්‍රමාණය හරියටම ගෙන එන්න)
8. **පොලිස් හා අනිකුත් නිදහස් කිරීමේ සහතික** - වයස අවුරුදු 16 හා එයට වැඩි අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ කොළඹ පොලිස් මූලස්ථානයෙන් නිකුත් කරන පොලිස් නිෂ්කාශන සහතිකය ඉදිරිපත් කළ යුතුයි.
   පොලිස් සහතිකය ලබා ගැනීමට පහත දැක්වෙන ලේඛන සමග කොළඹ 12 පිටකොටුවේ ඕල්කොට් මාවතේ අංක 31 හි පිහිටි (පොලිස් සුබසාධන ගොඩනැගිල්ල) පොලිස් මූලස්ථානයට, ඔබේ අයදුම්පත ඉදිරිපත් කරන්න.
   - ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්.
     ස්වාමිපුරුෂයාගේ පවුල් නාමය භාවිතා කරන කාන්තාවන් විසින් විවාහ සහතිකයේ පිටපතක් හා විවාහයට පෙර නම හා විවාහයට පසු නම දක්වන දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුයි.
   - උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
   - ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක්
   - ශ්‍රී ලංකා රුපියල් 500/= ගාස්තුවක්

   වයස 16 සිට ආවරණය කෙරෙන පොලිස් වාර්තාවක් තානාපති කාර්යාලයට අවශ්‍ය වේ. අයදුම්පත ඉදිරිපත් කරන විට ඔබට මෙම වාර්තාව "උපතේ සිට" ඉල්ලා සිටීමට පුළුවන. සති 3-4ක් ඇතුළත ඔබේ ලිපිනයට මෙම සහතිකය ලියාපදිංචි තැපෑලෙන් එවනු ඇත. පොලිස් වාර්තාව ලබා ගැනීම සඳහා වූ අයදුම්පත අන්තර්ජාලයෙන් බාගත කර ගැනීමට පුළුවන. (http://www.police.lk/divisions/clearence.asp) අයදුම්පත්, පොලිස් මූලස්ථානයෙන් ද ලබා ගත හැකියි.

   - **අනිත් රටවල පොලිස් නිදහස් කිරීමේ සහතික** - වයස 16 සම්පූර්ණ වීමෙන් පසුව අවුරුද්දකට වැඩි කාලයක් ජීවත් වූ රටවලින් ද වයස 16ට වැඩි අයදුම්කරුවන් පොලිස් නිදහස් කිරීමේ සහතික ඉදිරිපත් කළ යුතු වේ. ඒ ඒ රටවලින් මෙම සහතික ලබා ගැනීම පිළිබඳ තොරතුරු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ https://travel'state'gov/content/visas/en/fees/reciprocity-by-country.html වෙබ් අඩවියෙන් ලබා ගත හැකියි.
   - **උසාවි හා බන්ධනාගාර වාර්තා** - අපරාධයක් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්, චෝදනා ඉදිරිපත් කළ හෝ වරදකරු වූ අයදුම්කරුවන් එම අපරාධය හෝ වරද පිළිබඳ උසාවි වාර්තා හා/හෝ බන්ධනාගාර වාර්තා ඉදිරිපත් කළ යුතුයි.

- **හමුදා වාර්තා** - හමුදාවේ හෝ පොලිසියේ සේවය කර ඇති අයදුම්කරුවන් ඔවුන්ගේ හමුදා සේවා වාර්තා ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික නම් බටහිර නම්වලට වඩා ඉතා දීර්ඝ වේ. ඔබේ උප්පැන්න සහතිකයේ, අයදුම්පතේ හා ගමන් බලපත්‍රයේ සියලු ම නම් එක ම ආකාරයට එක ම අනුපිළිවෙළට තිබීම ඉතා වැදගත් වේ. ඒවා අතර යම් වෙනසක් ඇත්නම්. සම්මුඛ පරීක්ෂණ දිනයට පෙර ඒවා නිවැරදි කර ගත යුතු ය.

දික්කසාද වූ දෙමාපියන්ගේ බාල වයස්කාර දරුවන් (සම්මුඛ පරීක්ෂණ දිනට වයස අවුරුදු 18ට අඩු) සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණය පවත්වන නිලධාරියා ඉදිරියේ ඔහුගේ/ඇගේ එකඟත්වය දක්වන දිවුරුම් ප්‍රකාශයකට අත්සන් කිරීමට සංක්‍රමණය නොවන දෙමාපියා පැමිණීම අවශ්‍ය වේ. එසේ නැත්නම් සංක්‍රමණය වන දෙමාපියාට දරුවන් සම්බන්ධයෙන් පූර්ණ භාරකාරත්වය ඇති බවත් අනිත් දෙමාපියාට දරුවන් බැලීමේ අයිතියක් නැති බවත් දැක්වෙන උසාවි ලේඛනයක් ඉදිරිපත් කළ යුතු වේ.